# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2335/24 – 2023 ජුනි 09 වැනි සිකුරාදා – 2023.06.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/A/2016/38.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2018.01.04 දිනැති හා අංක 2052/22 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2017.12.28 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කොළඹ 01, ලෝටස් පාර, 'ඒ' ගොඩනැගිල්ල, 3 වන මහල හි පිහිටි සමස්ත ලංකා විදුලි සංදේශ සේවක සංගමය (සේවකයින් 2168ක් වෙනුවෙන්) කොළඹ 01, සහ ලෝටස් පාර හි පිහිටි ශ්‍රී ලංකා ටෙලිකොම් පී. එල්. සී. අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2023.02.20 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 මැයි මස 16 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

1A – G 039645 – 11 (2023/06)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.

සමස්ත ලංකා විදුලි සංදේශ සේවක සංගමය,
3 වන මහල, ''A'' ගොඩනැගිල්ල,
ලෝටස් පාර,
කොළඹ 01.
(සේවකයින් 2168ක් වෙනුවෙන්)

*පළමු පාර්ශ්වය*

නඩු අංකය: A 01/2018

යොමු අංකය: IR/COM/03/A/2016/38

ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී.
ලෝටස් පාර,
කොළඹ 01.

*දෙවැනි පාර්ශ්වය*

**ප්‍රදානය**

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍ය වේලාතන්ත්‍රිගේ දොන් ජෝන් සෙනෙවිරත්න මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියැවෙන) පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(2) වගන්තිය යටතේ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යවරයාට පැවරී ඇති බලතල ප්‍රකාරව, උක්ත ආරාවුල නිරවුල් කිරීම සඳහා 2017.12.28 දිනැති නියෝගයෙන් පහත සඳහන් ත්‍රිපුද්ගල කාර්මික අධිකරණයක් සංස්ථාපනය කොට පත්කොට යොමු කර ඇත.

1. ටී. පියසෝම මහතා,
2. එස්. විරිතමුල්ල මහතා සහ,
3. එස්. කාරියවසම් මහතා.

***කාර්මික අධිකරණ විභාගයේ පසුබිම, පෙනී සිටීම සහ එය පැවැත්වූ ආකාරය***

2017.12.28 දිනැති එකී නියෝගය මගින් කම්කරු සහ වෘත්තීය සමිති සබඳතා සහ සබරගමුව සංවර්ධන අමාත්‍යවරයා විසින් නිරවුල් කිරීම සඳහා අංක IR/COM/03/A/2016/38 දරන යොමුව යටතේ ඉහත කී සංස්ථාපනය කරන ලද කාර්මික අධිකරණය වෙත යොමුකර ඇති කාර්මික ආරාවුලට සම්බන්ධ කාරණය වන්නේ.

''ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී. ආයතනයේ ප්‍රධාන ව්‍යාපාරයේ සේවයේ යොදවා ඇති උපලේඛන 01හි සඳහන් සේවකයින් 2168 ට විධිමත් පත්වීමේ ලිපියක් ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී. වෙතින් ලබා නොදීමෙන් හා එම ආයතනයේ අනෙකුත් සේවකයින්ට ලබාදෙන වරප්‍රසාද හා සහන ලබා නොදීමෙන් අසාධාරණයක් සිදු වී තිබේ ද? එසේ නම් හිමිවිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ.''

මෙම කාර්මික ආරාවුල සම්බන්ධයෙන් විභාගයක් පැවැත්වීම සඳහා ඉහත කී කාර්මික අධිකරණ මඬුල්ලේ සාමාජිකයින් තිදෙනා ම මුල්වරට 2018.04.06 දින රැස් වූහ. එදින පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කරුවන් කිසිවෙකු හෝ ඔවුන් වෙනුවෙන් නීතිඥවරයෙකු හෝ නියෝජිතයෙකු සහභාගි වූයේ නැත. දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් එහි මානව සම්පත් අංශයේ

කේ. එස්. එන්. විජේවීර මහත්මිය ද, මානව සම්පත් කළමනාකරණ අංශයේ සහකාර කළමනාකාරිණී (කාර්මික සබඳතා) නීතිඥ ශාලා සාකර් මෙනෙවිය ද සහභාගි වූ අතර, ආයතනය වෙනුවෙන් නීතිඥ එම් ආඩමලි මහතා පෙනී සිටියේ ය.

නීතිඥ ආඩමලි මහතා මූලික විරෝධතාවක් ඉදිරිපත් කරමින් සැළකර සිටියේ මෙම කාර්මික ආරාවුල සම්බන්ධයෙන් අභියාචනාධිකරණයේ අංක CA/WRIT/76/2018 දරන නඩුව පවරා ඇති බවත්, එම නඩුව අභියාචනාධිකරණය විසින් භාරගෙන පාර්ශ්වකරුවන්ට නොතීසි යැවීමට තීරණය කර ඇති බවත්, එකී අභියාචනාධිකරණ නඩුකරයේ 4, 5 සහ 6 වගඋත්තරකරුවන් වශයෙන් මෙම කාර්මික අධිකරණයේ සාමාජිකයින් තිදෙනාම නම්කර තිබෙන බවත්, එම නිසා කාර්මික අධිකරණයේ දී මෙම විභාගය පැවැත්වීමේ නීතිමය ගැටළුවක් බවතින බවත් ය. එම නිසා කාර්මික අධිකරණයේ මෙම කාර්මික ආරාවුලට අදාළ විභාගය අභියාචනාධිකරණයේ පවරා ඇති නඩුවේ අවසානයක් වන තෙක් අත්හිටුවන ලෙසත් ඉල්ලා සිටියේ ය. එම සැළකිරීමේ ඇතුළත් කරුණු සලකා බැලූ කාර්මික අධිකරණයේ සාමාජිකයින් තිදෙනා ම එහි විභාගය අත්හිටුවීමට ඒකමතිකව තීරණය කළහ.

ඊට පසුව ද 2018.04.26 වැනි දින දී සාමාජිකයින් දෙදෙනෙකුගේ සහභාගිත්වයෙන් ද, 2018.05.11 දින දී සාමාජිකයින් තුන් දෙනාගේ ම සහභාගිත්වයෙන් ද අදාළ කාර්මික ආරාවුලට අදාළ කාර්මික අධිකරණය රැස් වී ඇත. ඒ අවස්ථාවල දී ද මෙම කාර්මික අධිකරණ විභාගය පැවැත්වීම සම්බන්ධ මූලික විරෝධතාව එල්ල වූ බැවින් ඒ සම්බන්ධ නීතිපතිවරයාගේ උපදෙස් පැතීමට තීරණය කරන ලදී.

කෙසේ වුවත්, පළමු පාර්ශ්වයත්, දෙවැනි පාර්ශ්වයත් 2021.03.01 දිනැති ව අත්සන් කොට ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ මෝසමක් ඉදිරිපත් කරමින් කාර්මික අධිකරණයේ විභාගය අවසන් කිරීම සඳහා කැඳවන ලෙස ඉල්ලීමක් කර තිබුණි. ඒ අනුව කාර්මික අධිකරණයේ විභාගය සඳහා 2022.01.21 දින පාර්ශ්වකරුවන් කැඳවන ලදී.

එකී ඒකාබද්ධ මෝසමේ සඳහන් පරිදි කාර්මික ආරාවුලේ සහන පැතූ සේවකයින් 2168 දෙනා අතුරෙන් 1967 දෙනෙකු ආයතනයේ බඳවා ගැනීමේ පටිපාටියට අනුකූලව බඳවා ගැනීමටත්, 198 දෙනෙකු ස්වේච්ඡාවෙන් ඉල්ලා අස්වීමටත්, 02 දෙනෙකු පත්වීම් භාර නොගැනීමටත්, 01 අයෙකු විනයානුකූල හේතූන් මත සේවය අවසන් කිරීමටත් තීරණය කරනු ලැබීමෙන් සහ ඊට දෙපාර්ශ්වය එකඟ වීමෙන් මෙම කාර්මික ආරාවුල නිරාකරණය වී ඇත.

තව ද, ඉහත කී සමථ කොන්දේසි යටතේ ආරාවුල සමථයකට පත් වී ඇති බැවින් අභියාචනාධිකරණයේ විභාග වූ අංක CA/WRIT/76/2018 දරන නඩුව 2022.05.04 දින අවසන් කරනු ලැබ ඇත.

එම නිසා මෙම කාර්මික ආරාවුල ඉහත කී සමථ කොන්දේසි මත සමථයකට පත් ව ඇති හෙයින් සජීවී කාර්මික ආරාවුලක් මේ වන විට නොපවතී.

මෙහි දී මතු වූ තවත් කරුණක් වූයේ අමාත්‍යවරයා විසින් සංස්ථාපනය කරන ලද කාර්මික අධිකරණයේ ත්‍රිපුද්ගල සාමාජික මණ්ඩලය සම්පූර්ණයෙන් රැස්වීමට ඇති අපහසුවයි. සාමාජිකයන් අතුරෙන් ටී. පියසෝම මහතා දීර්ඝ කාලයක් විදේශගත ව සිටින බැවිනුත්, එස්. කාරියවසම් මහතා දැඩිසේ රෝගාතුර ව සිටින අතර දැනට බේරුම්කරුවෙකු ලෙස කටයුතු නොකරන බැවිනුත් මෙම කාර්මික අධිකරණ විභාගය මා තනිව අසා අවසානයක් කොට ප්‍රදානය නිකුත් කිරීම යථායෝග්‍ය බවට පත් වී ඇත. එකී වාතාවරණය යටතේ මෙම කාර්මික අධිකරණ විභාගය මා තනි ව අසා අවසානයක් කොට ප්‍රදානය නිකුත් කිරීම සම්බන්ධයෙන් පූර්ණ එකඟත්වය පළමු පාර්ශ්වයත් දෙවැනි පාර්ශ්වයත් අත්සන් කළ ඒකාබද්ධ මෝසමක් මගින් ලිඛිත ව ඉදිරිපත් කර ඇත.

ඒ අනුව කාර්මික ආරාවුලට අදාළ ප්‍රදානය පහත දක්වමි.

## ප්‍රදානය

(1) කාර්මික ආරාවුලේ සහන පැතූ සේවකයින් 2168 දෙනා අතුරෙන් 1967 දෙනෙකු සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි සහන සැළසිය යුතු ය.

- සහනය පැතූ සේවකයින් 1967 දෙනෙකු ආයතනයේ බඳවා ගැනීමේ පටිපාටියට අනුකූල ව බඳවා ගැනීම.

(2) දෙපාර්ශ්වයේ සමථ කොන්දේසි මත කාර්මික ආරවුලේ සහන පැතූ ඉතිරි සේවකයින් 201 දෙනා සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි කටයුතු කළ යුතු ය.

- ඉන් සේවකයින් 198 දෙනෙකු ස්වේච්ඡාවෙන් ඉල්ලා අස්වනු ඇත.
- ඉන් සේවකයින් දෙදෙනෙකු පත්වීම භාර නොගනු ඇත.
- ඉන් එක් සේවකයෙකු විනයානුකූල හේතූන් මත සේවය අවසන් කිරීමට භාජනය වනු ඇත.

(3) ඒ අනුව දෙපාර්ශ්වයේ ඉහත කී සමථ කොන්දේසි මත කාර්මික ආරාවුල විසඳා අවසන් කරමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව ප්‍රකාශ කරමි.

එස්. විරිතමුල්ල.

2023 පෙබරවාරි මස 20 වැනි දින.

*EOG 06 - 0039*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.